බාලවයස්කාර දරුවෙකු හෝ දැරියක ලිංගික හිංසනයට පාත්‍ර කිරීම නීතිය ඉදිරියේ දඬුවම් ලැබෙනා වරදක් බව අමුතුවෙන් කිව යුතු නොවේ. නමුත්, මෙවැනි පුවත් වාර්තා කරනා ඇතැම් මාධ්‍ය මගින් යොදාගන්නා භාවාතිශය සිරස්තල ඔස්සේ, එවැනි අපරාධයක බරපතලකම සැහැල්ලු කොට දැක්වෙන බවද නිරීක්ෂණය කළ හැකි කරුණකි.

ඊට උදාහරණයක් ලෙසින්, ලංකාදීප පුවත්පතේ (09/15) "විද්‍යා ගුරා සිසුවියකට අමුතු පාඩකම් කියාදීලා" යන සිරස්තලයෙන් යුතුව පළවූ පුවත් වාර්තාව ඉදිරිපත් කළ හැක. මෙසේ නීතියෙන් දඬුවම් ලැබෙනා බාලවයස්කාර ලිංගික අපයෝජනයක්/හිංසනයක් "අමුතු පාඩමකට" ලඝු කොට, භාවාතිශය ආකාරයකින් දැක්වීම කෙතරම් ආචාර ධර්මානුකූලද?

එසේම, ගුරු වෘත්තිය වැනි වෘත්තියක යෙදෙන්නෙකු නිෂේධනාත්මකව දැක්වීමට යෙදෙන "ගුරා" වැනි අපහාසාත්මක යෙදුම් ඔස්සේ සමාජගත වන අදහස ගැටළුකාරී වන්නේ අදාළ එක් සිදුවීමක සැකකරුවෙකුට පමණක් නොවේ. එය සමස්ත ගුරු වෘත්තිය වෙතම එල්ල විය හැක. එලෙසින් බලන විට එයද ආචාර ධාර්මිකව ගැටළුකාරී වන භාෂා භාවිතයක් බවද මෙසේම පවසමු.

**#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa**